සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015
## Primary Piriven Year End Term Test - 2015

4 වසර / Grade 4

ඉතිහාසය
History

කාලය : පැය 03 යි.
Time : Three hours.

I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II වන කොටසින් තෝරා ගත් ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න.

## I කොටස.

(01) 1. අග්නිදිග ආසියාතික ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය පවතින රටවල් දෙකක් දක්වන්න.

2. බුරුමයේ සුප්‍රකට ස්වේදගොන් ස්තූපය කරවන ලද්දේ කුමන රජකෙනෙකු විසින් ද?

3. තායිලන්තයෙන් මෙරටට පැමිණි භික්ෂූන් වහන්සේ පිහිටුවනු ලැබූ භික්ෂු නිකාය සඳහන් කරන්න.

4. චීනයේ පවතින ප්‍රධාන ආගම් දෙකක් දක්වන්න.

5. ජපානයට බුදු දහම ලැබෙන්නට ඇතැයි සැලකෙන්නේ කවර රටවලින් ද?

6. පැරණි යුරෝපයේ දක්නට ලැබෙන ප්‍රධාන ශිෂ්ටාචාර දෙකක් දක්වන්න.

7. රෝම අධිරාජ්‍ය බිඳ වැටීමට හේතු වූ කරුණක් සඳහන් කරන්න.

8. චෝලයන් විසින් පොළොන්නරුව හැඳින් වූ නම ලියන්න.

9. ශ්‍රී ලංකාවේ පැරණි රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමේ පිළිවෙළ අනුව පළමුවන නිරිත දිග රාජධානිය කුමක් ද?

10. “කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත” යන උපාධි නාමය ලැබූ දඹදෙණි යුගයට අයත් රජතුමා කවුරුන් ද?

11. කෝට්ටේ රාජධානි සමයේ දී යාපනය ප්‍රදේශය පාලනය කළ කෝට්ටේ කුමාරයා කවරෙක් ද?

12. කෝට්ටේ යුගයේ රචිත සාහිත්‍ය කෘති 02 ක් දක්වන්න.

13. යුරෝපා ජාතීන් මෙරටට පැමිණීමේ අරමුණු 02 ක් දක්වන්න.

14. සෙංකඩගල රාජධානියේ ආරම්භක පාලකයා දක්වන්න.

15. ක්‍රි.ව. 1638 ලන්දේසීන් සමඟ ගිවිසුමක් ඇති කර ගත් උඩරට පාලකයා කවුද?

16. පෘතුගීසීන්ට විරුද්ධව මුල්ලේරියා සටන මෙහෙය වනු ලැබුවේ කවුරුන් විසින් ද?

17. දොන් ජුවන් පෙරිය බණ්ඩාර නමින් කතෝලික ආගම වැළඳගත් සිංහල රජු කවුද?

18. පෘතුගීසීන් “කන්ද උඩරට ද්‍රෝහියා” යන නමින් හැඳින් වූයේ කවරෙකුට ද?

19. ලන්දේසීන්ගේ පෙරදිග මධ්‍යස්ථානය පිහිටියේ ජාවා දූපතේ පිහිටි කුමන නගරයේ ද?

20. යුරෝපා ජාතීන් මෙරටින් ගෙන ගිය වෙළඳ ද්‍රව්‍ය 04 ක් දක්වන්න.

( ලකුණු 02 x 20 = 40 )

II කොටස.

(02) I. පස්වන සියවස පමණ වන විට බුරුමයේ වාසය කළ ජන වර්ග දෙකක් නම් කරන්න.

II. බුරුමයට බුදු දහම ලැබුණු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

III. තායිලන්තය හා ලංකාව අතර පැවැති ශාසනික සම්බන්ධතා පිළිබඳව හැඳින්වීමක් කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(03) I. චීනයේ බුදු සමය ප්‍රචාරය කිරීමට කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙනමක් නම් කරන්න.

II. කාම්භෝජ වාසීන් වෙනුවෙන් මෙරට පහසුකම් සලසා දුන් පාලකයා දක්වා,එසේ ලබා දුන් පහසුකම් දෙකක් දක්වන්න.

III. ජපානයෙහි බුදු සමය ප්‍රචාරය කිරීමේ දී භික්ෂූන්ට විඳීමට සිදු වූ අභියෝග සාකච්ඡා කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(04) I. රෝම අධිරාජ්‍යයට එල්ල වූ ආක්‍රමණ දෙකක් දක්වන්න.

II. වැඩවසම් ක්‍රමය යනු කුමක් දැයි කෙටියෙන් දක්වන්න.

III. වැඩවසම් ආර්ථික ක්‍රමයේ විශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න.

( ලකුණු 4+5+6 = 15 )

(05) I. ලංකාව ආක්‍රමණය කළ චෝල පාලකයන් දෙදෙනෙකු දක්වන්න.

II. චෝලයන් පොළොන්නරුව අග නුවර ලෙස තෝරා ගැනීමට හේතු වූ කරුණු තුනක් දක්වන්න.

III. බුදු සමයේ දියුණුව වෙනුවෙන් I වන පරාක්‍රමබාහු රජු ගනු ලැබූ ක්‍රියාමාර්ග විස්තර කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(06) I. දඹදෙණියේ II වන පරාක්‍රමබාහු රජුට මුහුණ දීමට සිදු වූ විදේශ ආක්‍රමණ දෙකක් දක්වන්න.

II. ගම්පල රාජධානියක් වශයෙන් තෝරා ගැනීමට හේතු වූ කරුණු කෙටියෙන් පහදන්න.

III. කෝට්ටේ යුගයේ ඇති වූ සාහිත්‍ය දියුණුව පිළිබඳව හැඳින්වීමක් කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(07) I. වෙළඳාම සඳහා අතීතයේ මෙරටට පැමිණි විදේශීය ජාතීන් හතරක් දක්වන්න.

II. "විජයබා කොල්ලය" පිළිබඳව කෙටියෙන් විස්තර කොට ඉන්පසු කෝට්ටේ රාජධානිය බෙදී ගිය කොටස් 03 දක්වන්න.

III. I රාජසිංහ රජු හා පෘතුගීසීන් අතර සිදු වූ සටන් පිළිබඳව හැඳින්වීමක් කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(08) I. කතෝලික ආගම පැතිර වීමට පෘතුගීසීන් ගෙන ගිය ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

II. පෘතුගීසීන්ගේ බලපෑම් නිසා මෙරට ජන සමාජයේ ඇති වූ වෙනස්කම් 02 කෙටියෙන් විස්තර කරන්න.

III. II වන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ක්‍රි.ව.1638 ඇති වූ සිංහල - ලන්දේසි ගිවිසුමේ අඩංගු කොන්දේසි හා එම ගිවිසුමේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.

( ලකුණු 4+5+6 = 15 )

(09) I. උඩරට රාජ්‍ය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර දෙකක් දක්වන්න.

II. I වන විමලධර්මසූරිය රජු ශාසනික දියුණුව සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කෙටියෙන් දක්වන්න.

III. ලන්දේසි පාලනය නිසා මුහුදු බඩ ප්‍රදේශවල ඇති වූ වෙනස්කම් විස්තර කරන්න.

( ලකුණු 4+5+6 = 15 )